# ඉවසන්න! අනුන් කළ වරදට කෝප වී දුක් විඳින්න එපා

## ඛුද්දකවත්ථුවිභඞ්ගො ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා අභිධර්ම පිටකය, විභඞ්ගප්පකරණ 2 - පිටු අංක 242 - 243)

අක්ෂාන්තියෙහි (අනුන් කළ වරදට කෝප වීමෙහි, අකරුණාවෙන් සහ ද්වේෂයෙන් යුක්ත ව නොඉවසීමෙහි) ආදීනව පසකි.

- බොහෝ දෙනාට අප්‍රිය අමනාප වෙයි.
- වෛර බහුල ව ජීවත් වෙයි.
- වැරදි බහුල ව දෝෂ බහුල ව ජීවත් වෙයි.
- සිහි මුළා වී කළුරිය කරයි.
- මරණින් මතු සැප නැති, කටුක වූ දුක් ඇති නිරයට පැමිණෙයි.